// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2131/21 - 2019 ජූලි මස 09 වැනි අඟහරුවාදා - 2019.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත

57 වන වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රවී කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 ජුනි මස 27 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 320 නෝර්වුඩ් ග්‍රාම නිලධාරී වසමේ, නෝර්වුඩ් (ගෝර්ති) ග්‍රාමයේ පිහිටි රජයේ වරලත් මිනින්දෝරුවරයකු විසින් පිළියෙල කරන ලද පිඹුරුපත් අංක 1055 දරන 2019.03.15 දිනැති සැලැස්මෙහි ලොට් අංක 1 වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණය පර්චස් 25 ක් වූ ඉඩම.

*උතුරට* : ග්ලැන්ටිල්ට් වත්තේ කොටසක් සහ වතු පාර
*නැගෙනහිරට* : වතු පාර සහ ග්ලැන්ටිල්ට් වත්තේ කොටසක්
*දකුණට* : ග්ලැන්ටිල්ට් වත්තේ කොටසක්
*බටහිරට* : ග්ලැන්ටිල්ට් වත්තේ කොටසක්.

*හිමිකම් කියන අය* : රිචඩ් පීරිස් සහ සමාගම, 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

07 - 786

1A - G 30484 — 27 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*